# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
## මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
## தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

105 - 5th Lane, Colombo - 03, Sri Lanka
Tel: +94 11 2564404, Fax: +94 11 4722632
E-mail: cmev@cpalanka.org Website: http://cmev.wordpress.com

### දකුණු පළාත් සභා ඡන්ද විමසීම - 2009

### මාධ්‍ය නිවේදනය - අංක 04

2009- ඔක්තෝබර් 05

**2009 ඔක්තෝබර් 6 කොළඹදීය"** ක්ෂේත්‍ර නිරීක්ෂකයන්ගේ CMEV ය වෙත ලැබුණු වාර්තා අනුව දකුණු පළාතේ මැතිවරණයට අදාලව සමස්ත ප්‍රචණ්ඩ ක්‍රියාවන් සංඛ්‍යාව 64 කි. මෙම සමස්ත සිදුවීම් 64 අතරින් සිදුවීම් 18 ක් බරපතල සිදුවීම් ලෙස වර්ගීකරණය කරතිබේ. මෙම බරපතල සිදුවීම් 18 අතරින් සිදුවීම් 11ක් වාර්තා වන්නේ ගාල්ල දිස්ත්‍රික්කයෙන් වන අතර සමස්ත සිදුවීම් 64න් 28 ක් සිදුවී ඇත්තේද එම දිස්ත්‍රික්කයෙන්ම වේ. සිදුවීම් 22 ක් හා 14 ක් පිළිවෙලින් හම්බන්තොට සහ මාතර දිස්ත්‍රික්ක වලින් CMEV වෙත වාර්තා වී ඇත.

**ඡන්දය දැමීමට උනන්දුව හීනවීම - දෙනියාය මැතිවරණ කොට්ඨාශය - මාතර**

CMEV නිරීක්ෂකගේ වාර්තාවන් අනුව දෙනියාය මැතිවරණ කොට්ඨාශයේ රිදියගල ගම්මානයේ වැසියන්, ඔක්තෝබර් 10 වන දින පැවැත්වීමට නියමිත දකුණු පළාත් සභා මැතිවරණයේදී ඡන්දය දීම වර්ජනය කිරීමේ සුදානමක් තිබේ. පක්ෂ භේදයකින් තොරව ගම්වැසියන් මෙම තීරණය ගෙන ඇත්තේ දේශපාලකයින් කෙරෙහි ඇති විශ්වාසය බිඳවැටීම හේතුවෙන් බව වාර්තා වේ. මෙකී ගම්වැසියන් CMEV නිරීක්ෂකයාට ප්‍රකාශ කර ඇත්තේ තමන්ගේ ගමට ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය කරදීමේ පොරොන්දුව කිසිදු දේශපාලකයකු විසින් ඉටු කර නැති බවත් එයින් කලකිරීමට පත්වීම හේතුවෙන් සිය ගම්මානයේ තිබූ පක්ෂ කාර්යාල ඉවත් කර දැමීමට තීරණය කල බවත්ය.

මාර්ගයෙන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකෙරෙන තුරු කිසිදු දේශපාලන පක්ෂයකට සහය නොදැක්වීමට ඔවුන් තීරණය කර ඇත. මෙම ගම්මානයේ ග්‍රාම සේවා නිලධාරි තුමා CMEV ආයතනයට වාර්තා කර සිටියේ, මෙහි පවුල් 407 ක් සහ ඡන්ද දායකයින් 1088 ක් සිටින බවයි.

ඔක්තෝබර් 04 වැනි දින CMEV ආයතනයට වාර්තා වු තොරතුරු අනුව අදාල නිලධාරින් විසින් මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට පියවරගෙන ඇත. මේ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මාර්ග දෙපස තිබූ බව CMEV නිරීක්ෂක විසින් වාර්තා කරන ලදි. තවද මේ පිළිබඳව දැනුවත් කිරීම සඳහා පළාත් සභාවේ ඉංජිනේරුවරයෙකු සහ තවත් නිලධාරින් කීප දෙනෙකු සහභාගී වු රැස්වීමක් ද පැවැත්වුනි.

ඉහත කී තත්වය තුලින් දේශපාලකයින් කෙරෙහි ඇති කලකිරුණු ස්වභාවය සමාජයේ යම් යම් ප්‍රජා කොටස් තුල ඇති ආකාරය පෙන්වා දේ. එකී තත්ත්වයන් සඳහා නීති ප්‍රතිකර්ම නොයෙදීම රටේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය තුල අහිතකර ප්‍රතිකර්ම ඇති කරනු ඇත.

**මාතර දෙනියායේදී එ.ජා.ප පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එල්ල වු ප්‍රහාරය**

වරාය සංවර්ධන කටයුතු අමාත්‍ය ඩිලාන් පෙරේරා මහතා සමග සිටින ලද කණ්ඩායමක් විසින් එ.ජා.ප. පාර්ලිමේන්තු කණ්ඩායමට හා ආධාරකරුවන්ට පසුගිය 04 වන දින පෙ.ව. 11.00 ට පමණ පහරදීමක් සිදුවු

බව CMEV වෙත වාර්තා වී ඇත. මෙය දෙනියාය මැතිවරණ කොට්ඨාශයේ පිහිටි බෙවරලිය වතුයාය අසලදී සිදුවී ඇත.

තුසිත රණවක යන අය විසින් එ.ජා.ප. මහලේකම් තිස්ස අත්තනායක, පාර්ලිමේන්තු මන්ත්‍රී රවී කරුණානායක, පාලිත රංගෙබණ්ඩාර හා ලක්ෂ්මන් කිරිඇල්ල යන අය සහ ඔවුන්ගේ ආධාරකරුවන් පිරිසකට බාධා එල්ල කළ බව එ.ජා.ප. පාර්ලිමේන්තු මන්ත්‍රී සාගල රත්නායක මහතා CMEV යට වාර්තා කරන ලදී.

මග නැගුම වැඩසටහන යටතේ යම් පුද්ගලයකු වෙනුවෙන් මාර්ගයක් ඉදිකර ඇතැයි එනසාල්වත්ත හා බෙවරලිය වතුයාය ප්‍රදේශයේ ඡන්ද දායකයන් විසින් ලබාදුන් තොරතුරක් අනුව එ.ජා.ප. පිරිස එම ස්ථානයට ගොස් එය පරීක්ෂා කරමින් සිටියදී මෙය සිදුවිය. සාගල රත්නායක මහතා තවදුරටත් ප්‍රකාශකරන ලද්දේ ලොරියක් හරස්කර ඔවුන්ගේ ගමනට බාධාකර ඉන් ඉදිරියට යාමට ඉඩනොදෙන බව දැන්වූ විට එම ස්ථානයෙන් ඉවත් වීමට උත්සාහ කළ අවස්ථාවේදී ඩිලාන් පෙරේරා මහතා සමග සිටි එ.ජ.නි.ස. ආධාරකරුවන් පිරිසක් පැමිණ එ.ජා.ප. ආධාරකරුවන්ට හා ජනමාධ්‍යවේදීන්ට පහර දී ඔවුන්ගේ වාහන වලටද අලාභහානි කල බවය.

CMEV ය විසින් තිස්ස අත්තනායක මහතාගෙන් විමසූ විට ඔහු ප්‍රකාශ කරන ලද්දේ මෙම සිද්ධිය පිලිබඳව දෙනියාය හෝ මාතර පොලිස් ස්ථාන වලට පැමිණිල්ලක් නොකල බවත් කොළඹ පොලිස් මූලස්ථානයට පැමිණිල්ලක් කිරීමට බලාපොරොත්තු වන බවත්ය. ඔහු තවදුරටත් ප්‍රකාශකරන ලද්දේ දෙනියාය එ.ජ.නි.ස. සංවිධායක විජය දහනායක මහතා එම අවස්ථාවට මැදිහත් වී තත්වය සමථ කිරීමට හා ඔවුන්ට ඉවත් වීමට උදව් කළ බවය.

CMEV ය විසින් අමාත්‍ය ඩිලාන් පෙරේරා මහතාගෙන් මේ පිළිබඳව විමසූ විට ඔහු මෙම චෝදනා ප්‍රතික්ෂේප කළ අතර තුසිත රණවක මහතාගේ නිවසේ තේ පැන් සංග්‍රහයක් සඳහා ඔවුන්ට ආරාධනාවක් ලැබුණු බවත් ඔවුන් එහි යන අතරතුර එ.ජා.ප. රථ පෙළපාලියක් ඔවුන්ට බාධා කළ බවත් ඒ නිසාවෙන් ඔහු තම ආරක්ෂක නිලධාරින්ට එම වාහන ඉවත් කරන ලෙස උපදෙස් දුන් බවත්ය. ඔහුගේ ආරක්ෂක නිළධාරින් එ.ජා.ප. ආධාරකරුවන්ගේ වාහන ඉවත් කර ගැනීමට උදව් කල බව ඔහු ප්‍රකාශ කරන ලදී. ඔහු තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ ඔවුන්ගේ ආධාරකරුවන් කිසිවකු කිසිදු ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක නොයෙදුන බවයි.

මැතිවරණ ප්‍රචාරක කටයුතු අවසන් අදියර කාලසීමාවේ දී යම් උණුසුම්කාරී තත්ත්වයක් වර්ධනය විය හැකි නිසාවෙන් දේශපාලන පක්ෂ, මැතිවරණ කොමසාරිස් හා පොලිසිය නිසි පියවර ගෙන ජනතාවට අවහිරතාවයකින් තොරව සිය ඡන්දය භාවිතා කල හැකි වාතාවරණයක් ඇති කරන මෙන් CMEV ආයතනය ඉල්ලා සිටී.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.



නීතිඥ තුසිත සිරිවර්ධන
ජාතික සම්බන්ධිකාරක

0717019730